# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2045/23 - 2017 නොවැම්බර් මස 15 වැනි බදාදා - 2017.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KDS/KGK/4/2/2015/2/1.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/180.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුල්ගම්පොල (243) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෙල් අට කොට්ඨාස අංක 1, පේරාදෙණිය (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2017.10.30 දිනැති, අංක මහ 6727 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ''විලියම් ගොපල්ලව මාවත, වරිපනම් අංක 595/1, බෝ ගහ යට පැල'' නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0351 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස;

01. කැබලි අංක 01

ඉඩමේ නම: විලියම් ගොපල්ලව මාවත, වරිපනම් අංක 595/1, බෝ ගහ යට පැල; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: මහින්ද කටුගහ මහතා, අංක 39/4 - 1/3, රජපිහිල්ල මාවත, මහනුවර; ප්‍රමාණය: හෙක්. 0.0351.

*මායිම්* :

*උතුරට* : මූලික පිඹුර මහ 3859 හි කැබලි අංක 2, මාර්ගය සහ එස්. කේ. බී. යටිවැල්ල හිමිකම් කියන වලව්වෙත්ත නොහොත් බෝ ගහ යට පැලැස්ස; *නැගෙනහිරට* : එස්. කේ. බී. යටිවැල්ල හිමිකම් කියන වලව්වෙත්ත නොහොත් බෝ ගහ යට පැලැස්ස සහ තුන්බෝමළුව විහාරයේ විහාරාධිපතින් වහන්සේ හිමිකම් කියන බෝ ගහ යට පැල; *දකුණට* : තුන්බෝමළුව විහාරයේ විහාරාධිපතින් වහන්සේ හිමිකම් කියන බෝගහ යට පැල සහ මූලික පිඹුර මහ 3859 හි කැබලි අංක 14; *බටහිරට* : මූලික පිඹුර මහ 3859 හි කැබලි අංක 14, 15 සහ 2.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 14 වැනි දින පෙ.ව. 10.00 ට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතුයි.

තවද 2017 දෙසැම්බර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර
සහ ගඟවට කෝරළේ.

2017 නොවැම්බර් මස 11 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1330

---

ශුද්ධි පත්‍රිකාවයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අංක 521/22 සහ 1988 සැප්තැම්බර් 01 වන දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා බැඳේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව (උතුර) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මීටියාගොඩ ගමේ පිහිටි, මූලික පිඹුරු අංක ගා. 2198 හි කැබලි අංක 01 කුරුඳුවත්ත නැමැති ඉඩම.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කුරුඳුවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10 - 25 ක් දක්වා වයසැති කොස් ගස් 03ක් ද, අවුරුදු 10 - 15 වයසැති තැඹිලි ගස් 15ක් ද, ගම් උළු සෙවිලි කරන ලද කපරාරු ගොඩනැගිලි 4ක් ද කපරාරු කරන ලද වතුර ටැංකියක් ද, වැසිකිළි 4ක් ද තහඩු සෙවලි කළ ගරාජයක් හා කපරාරු කළ මුරකුටියක් ද ඇත; ප්‍රමාණය: හෙක්. 0.394.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 08 වැනි දින පෙ.ව. 9.00 ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ වියයුතුයි.

තවද 2018 ජනවාරි මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩම්වල තම අයිතිය තහවුරු කිරීම සඳහා අදාළ ඔප්පු සහ වෙනත් ලිපි ලේඛන පරීක්ෂණ දිනයේ දී රැගෙන ආ යුතුයි.

එච්. කේ. සරසි එස්. ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2017 නොවැම්බර් මස 09 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1331

---

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ අංක 1989/64 හා 2016 ඔක්තෝබර් 22 වන දින *අති විශෙෂ ගැසට් පත්‍රයට* අදාළ සංශෝධනය

*මගේ අංකය* : මීරි/ප්‍රා.ලේ/ඉ/3/2016/4.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/7/2016/එච් ඩබ්ලිව්/51.

පවරා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 10 වල්බෝතලේ ග්‍රාම නිලධාරි වසමේ වල්බෝතලේ ගමේ පිහිටි මැනුම්පති වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ගම් 4000 සහ 2016.10.26 දිනැති සිතියමේ පහත විස්තර සඳහන් කර ඇති අංක 17 සහ 18 කැබලිවල කැබලි අංක පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය.

**අංක 17 කැබලි අංක 17**
ඉඩමේ නම: ගම්මස්සමකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය;මුල් හිමිකම් කියන්නා: මීරිගම වල්බෝතලේ අංක 33/2 පදිංචි විජේසිංහ පතිරන්නැහැලාගේ දොන් ලකී ලයනල් විමලධර්ම; ප්‍රමාණය: හෙක්. 0.0728.

**අංක 18 කැබලි අංක 18**
ඉඩමේ නම: ගම්මස්සමකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය;මුල් හිමිකම් කියන්නා: සුහසිංහ ගමලත්ගේ ඇසලින් නෝනා; ප්‍රමාණය: හෙක්. 0.0515.

වයි. අයි. එම්. සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2017 නොවැම්බර් මස 08 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1332

ශුද්ධි පත්‍රය

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත**
**(460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MCUDP/LA/KOL(W-16)/16/01.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/10/2016/LRB/425.

උක්ත ශීර්ෂය යටතේ අංක 2043/50 හා 2017.11.02 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ මා විසින් පළ කරන ලද දැන්වීමෙහි දැක්වෙන, අත්කරගන්නා මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 2.0081 ලෙසත් මූලික පිඹුර පිළියෙළ කළ දිනය 2017.10.20 ලෙසත් නිවැරදි විය යුතු බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කරගැනීමේ නිලධාරි,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය,
කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

11 - 1333

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.